# ලංකාවේ ජාතික ධන නිධාන සංරක්ෂණය කිරීම


රටක ජාතික ධනය කොටස් කීපයකට බෙදිය හැකිය. එයින් භෞතික ධනය එක් කොටසකි. මෙහිදී අපේ විමසීමට භාජනය කරන්නේ ලංකාවේ ස්වාභාවික ධන නිධාන සංඛ්‍යාවෙහිලා සැලකෙන පස, ජලය, කැලෑ, වන සතුන් සහ මත්ස්‍ය යන සම්පත් ය. මේ සම්පත් අතුරින් සමහරක් අප දිවයිනෙහි සෑහෙන ප්‍රමාණයක් ඇත. සමහරක් සීමිතය. මේවායින් ජලය හා පස උත්පාදනය කිරීම මනුෂ්‍ය පාලනයෙන් තොරය. ස්වාභාවික වැඩීමෙන් දියුණු වන හා මනුෂ්‍ය පාලනයට නොනැමෙන සම්පත් හැටියට වනාන්තර, වන සතුන් හා මසුන් සැලකිය හැක. මේ සියළුම සම්පත් මිනිසාගේ විනාශකාරී අපිරිමැස්ම හේතුවෙන් දිනපතාම අඩුවන්නට පටන් ගනී. මිනිසාගේ උවමනාවන් වැඩි වත්ම ස්වාභාවික සම්පත් වලින් පල ප්‍රයෝජන ගැන්ම වැඩිවීම නොවැලැක්විය හැකි කරුණකි. සම්පත් භාරය සීමිත නිසා ඒ පිරිමැස්නා අන්දමින් පරිහරණය කිරීම රටක ජාතික ධනය රැකීමෙහිලා ඉතා වැදගත් වන්නේය.

විශේෂයෙන්ම යටත් විජිතයක්ව අධිරාජ්‍ය වාදීන්ගේ ආර්ථික ව්‍යාපාරයන්ට ගොදුරු වූ ලංකාවේ එම ස්වාභාවික ධන නිධාන සංරක්ෂණයෙහිලා මෙතෙක් දක්වා ඇති සැලකිල්ල ප්‍රමාණවත් නොවේ. නිදහස් රටක් වශයෙන් අද ලංකාවේ ජාතික ධනය නැංවීමට මෙම ධන නිධානයන් සංරක්ෂණය පිළිබඳ උවමනාව පෙරමුණ ගත යුතුව තිබේ. මෙහිදී ඒ එක් එක් ජාතික ධන නිධානයන්ගේ පිළිවෙත් ඒවා සංරක්ෂණය කළයුතු අන්දමත් සලකා බැලිය යුතුව ඇත.



ජලය අපේ වටිනා සම්පත්තියකි. සෑම ජීවයකටම ජලය අවශ්‍යය අද ජලය කෘෂිකර්මයට හා ගෙදර දෙරේ වැඩට පමණක් නොව කාර්මික හා ඉංජිනේරු වැඩට පවා ඇවැසි බව අමුතුවෙන් කිවයුතුව නැත. මිනිසෙකු පාවිච්චියට ගන්නා වතුර ප්‍රමාණය අනුව අපට ඔහු වෙසෙන රටේ දියුණුව පවා මැනගත හැක. ලෝකයේ වෙනත් රටවල් හා බලන කල ලක් වැසියෙකු පාවිච්චි කරන ජල ප්‍රමාණය අඩුය. අප කාර්මික කෘෂිකාර්මික සමාජිය අතින් දියුණු විය යුතු නම් ක්‍රමවත්ව ජල සම්පත සොයා පාවිච්චි යට ගත යුතුය. දිවයිනේ වර්ෂාව අධික උවත් වැටෙන ජලයෙන් වැඩි කොටසක් ගලා යන්නේ මුහුදටය.

මේ ගලායෑමේ හේතුවෙන් දිවයිනේ සාරවත් පසද මුහුදට ඇදී යයි. අප රටේ පොළෝතුළ කොතරම් ජලය ඇද්දැයි අද වනතාක් සොයාගෙන නැත. පොළෝ තුළින් ලබන ජලයේද ප්‍රයෝජනය ගන්නේද ඉතා සුළු කොටසකි. මෙසේ සලකන විට අපි ජල සම්පතින් නිසි ඵල ලබන්නෝ නොවෙමු. මේ නිසා ලංකාවේ ජල සංරක්ෂණය ගැන අප්‍රමාදව සැලකිල්ල යොමු කළ යුතුව තිබේ. මේ සඳහා පර්යේෂණ අවශ්‍යය. වාෂ්පීකරණයට හා මතුපිට ගලායෑමට අසුවූ ජලය අත්හැර කිඳා බසින ජල ප්‍රමාණය මැනීමත් පොළෝ තුළ ජලය රැඳී ඇති ජලාශයන් ගැන සෙවීමත් ඉටු කළ යුතු පර්යේෂණ කාර්‍යයන් ය. දිවයිනේ ජල සංරක්ෂණයේ යෝග්‍යතාවය සිංහල රජකාලේ සිට පිළිගත් කරුණකි. නියං කල භාවිතයටත් ගංවතුර ගැලීම වැළැක්වීමටත් ජලය රැස්කොට තබා ගත හැකි විශාල ජලාශ තැනීම එදමෙන්ම අදත් අවශ්‍ය වන්නේය. රටේ ආර්ථික සංවර්ධන ව්‍යාපාරයන්ට මින් ලැබෙන සේවය ඉමහත්ය.



කෘෂිකාර්මික රටක් වන ලංකාවේ පස් සංරක්ෂණය ගැන දක්වන සැලකිල්ල කිසිසේත් ප්‍රමාණවත් නොවේ. පොළෝ මත පස් තට්ටුව අඟල් කීපයකට වඩා ගැඹුරු නැත. පැළෑටි ආහාරවන භියුමස් ඓන්ද්‍රිය සහ පෝෂ්‍යදායී දේ තිබෙන්නේ මෙහිය. මේ මුදුන් පස් තට්ටුව පාසි හැරෙන්නට වෙනයමක් නොවේ. වගාවන්ගෙන්ද කැලෑ කැපීමෙන් හෝ උලාකන සතුන් නිසා හෝ ස්වාභාවික වෘක්ෂලතා නැතිවීමට පුළුවන. මේ ව්‍යාපාරයන් නිසි ලෙස නොකළොත් නක්නීකරකරණය උග්‍රවී අවුරුදු සියයකින් පමණ සැදුණු පස් ප්‍රමාණයක් දවසකින් දියට ගසාගෙන යන්නට පුළුවන. සෝදපාළුව යන්නෙන් අදහස් කරන්නේ මිනිසා විසින් උග්‍ර කර ඇති මේ නක්නීකරණයයි. ලංකාවේ පස් සෝදයාම සිදුවන්නේ වැසි වැටීමේ වේගය නිසාත් පැළෑටිවලින් පස් ආවරණය නොවීම නිසාත් ය. ශාකාවරණය විනාශ වීමෙන් පස සෝදයාම ඉක්මන් කරයි. මේ කොතරම් දුරට ලංකාවේ සිදුවේද කියතොත් කඳුකරේ දියපාරවල් අසල පිහිටි වන ලැහැබ ආරක්ෂා කිරීමට නීති තිබේ. ගංගාවල ඉහළ නිම්නයේ සෝෂක පෙදෙස්ද මේ නීතියෙන් ආරක්ෂාවේ. එහෙත් මේ නීතියට ආරක්ෂා වූ පෙදෙස් ඉතා ටිකය. හේන් ගොවිතැන හා වගා කරන වැරදි ක්‍රමද ලංකාවේ පස් සෝදයාමට බොහෝ විට හේතුවේ. වන නාශනය පස ඛාදනය නිසා අනියම් වශයෙන් දුර්විපාක රාශියක් සිදුවේ. වර්ෂාපතනය අඩුවීම, ගමනාගමන අවහිරවීම, වාරිමාර්ග කටයුතුවලට ජලය අඩුවීම හා නිපදවිය හැකි ජල විදුලි බලය අඩුවීම යටිපසේ ජල මට්ටම පහළ බැසීම හා අස්වැන්න අඩුවීමෙන් ජීවන තත්ත්වය පිරිහීම යන මේ දුර්විපාක රටේ ජාතික ධනය නාස්ති කිරීමට අනුබල දෙයි. මින් පැහැදිළි වන්නේ පස් සෝදයමේ භයානක කමය. මේනිසා ලංකාවේ ධන

නිධාන සංරක්ෂණයේ මුල් තැනක් පස සංරක්ෂණය සඳහා දිය යුතුව ඇත. පස සෝදායාම මැඩ පැවැත්වීමට කළයුතු ප්‍රධාන දේ නම් පස මතුපිට වැටෙන වැසි ජලය නිසියාකාර ලෙස ගලායාමට ක්‍රම සැලසීමය. පසට වැටෙන වර්ෂාවේ වේගය අඩු කිරීමෙන්, වැඩි ජලය පසටම උරා ගැනීමට ක්‍රම යෙදීමෙන්, වැඩි පුර ලැබෙන ජලය පාලනය කිරීමෙන් මේ කළ හැක. පස ආවරණව තැබීම මෙහිලා ඉතා වැදගත් ය. ''මිනිසාට මුදුන් පමුණුවා ගත හැකි ශ්‍රේෂ්ඨ ක්‍රියාවක් නම් පස ඛාදනය වලක්වාගැනීමය.'' ඛාදනය සිදුවීමේ ප්‍රතිඵලය ඉඩම්වලට පමණක් නොව මිනිසාටද විඳින්නට සිදු වෙත්. ලංකාව වැනි කෘෂිකාර්මික රටක ඇති ප්‍රධාන ස්වාභාවික සම්පත වූ මතුපිට පස රැක ගැනීමට සැම ප්‍රයත්නයක්ම දැරිය යුතුව තිබේ.




වන සම්පතද කොයි රටකත් ජාතික ධන නිධාන අතුරින් ඉහළ තැනක් ගන්නේ ය. ලංකාවේ වනාන්තර විශාල දැව කර්මාන්තයකට මුල් නුවූවත් වනයෙහි උපදින නොයෙක් ද්‍රව්‍ය රැස් කිරීමටත් දැව භාවිතයෙන් ගේදෙර හා නොයෙකුත් ගෘහ භාණ්ඩ තනා ගැනීමටත් ඉන්ධනයක් වශයෙ නුත් ලක්වැසියාට ඉතා ප්‍රයෝජනවත් වේ. නිවර්තන වනාන්තරවලින් විවිධ ගෙඩි වර්ග, කෙඳි පොතු ආදිය වටිනා ඖෂධ වර්ග රැස්කර ගැනීමටත් ඒවා මගින් සුළු කර්මාන්ත ඇති කර ආර්ථික ව්‍යාපාරයන් ඇරඹීමටත් ඉඩ කඩ ඇත. මෙරටට උවමනා දැව වලින්ද ඉතා සුළු ප්‍රමාණයකි ලංකාවේ වනාන්තර වලින් තවමත් ලැබෙන්නේ. වන සම්පත රැක ගැනීමේ වැදගත් දැව හා වන ද්‍රව්‍ය ලබා ගැනීම කෙරෙහි පමණ නොරඳයි. වනයෙහි සෞන්දර්ය හා විනෝදයට ඉන් සැලසෙන ඉඩ ඇති කිරීම අතින්ද ඒ අගනේය. ජලය රඳවාගෙන බලය සඳහා යොදන දෙලවල් ගැලීම ක්‍රමවත් කිරීමටත් හානිකර ගංවතුර වැලැක්වීමටත් නියඟය තරමකින් වත් මැඩ පැවැත්වීමටත් වනාන්තර පිරිමැසේ. මේනිසා දිවයිනේ වන සංරක්ෂණ ව්‍යාපාරය දියුණු කරලීම බොහෝ කරුණු අතින් වැඩදායකය. දුර නොදක්මේ මිනිස් ගතියට දුක්මුසු නිදසුනකි වන නැස්ම. වන නැස්ම අධික ජනගහනය ඇති ශිෂ්ඨ රටවලට දැව හා වෙනත් ද්‍රව්‍ය ලබාගැන්ම වලක්වනු පමණක් නොව හානිකර ආර්ථික සාමාජික විපාකද ඇති කරවයි. වන සංරක්ෂණ හොඳ වැඩ පිළිවෙලක පැහැදිළි මූල ධර්ම කීපයක් ඇතුළත් වේ. වන රැකීම පමණක් නොව වන රෝපණයද ඊට ඇතුළත් ය. වන සංරක්ෂණයේ අදහස වන ද්‍රව පරිහරණ සීමා කිරීමත් නොව හැකිතාක් සම්පූර්ණව වැවීම හා ඉතා නැනවත් ලෙස ඉන් වැඩ ගැනීමය. වන සම්පත් නිසිසේ පාලනය කිරීමට නම් රටක්

වශයෙනුත් පුද්ගලයන් වශයෙනුත් අප විසින් පුරුදු කළයුතු යම්කිසි පිළිවෙත් ඇත. මේරූ ගස් පමණක් අනෙක් ගස්වලට හානි නොපැමිණෙන සේ කපා හෙලිය යුතුය. ගින්නෙන් කෘමීන්ගෙන් රෝගවලින් හා උලාකන සතුන්ගෙන් සෑහෙන පමණට වන පෙත් රැක ගත යුතුය. වන රැක්ම සඳහා ලංකාවේ අභය භූමි හා ආරක්ෂිත ප්‍රදේශ තරමක ප්‍රමාණයක් වත් වෙන් කොට තැබීම ඉතා වැඩදයකය. වන රෝපනයද දැනට මෙහි අරඹා තිබීමද සතුටට කරුණකි. මැනවින් ආරක්ෂා කරමින් නැවත නැවත වැවුවොත් ලංකාවේ වනාන්තර වලින් මෙරටට උවමනා දැව වලින් සෑහෙන කොටසක් ලබා ගත හැකි වේ. පස සංරක්ෂණය ගැන කරුණු සඳහන් කරද්දී දක්වූ වන නාශනයෙන් සිදුවිය හැකි අනියම් විපාකද වලක්වා ගැනීමට හැකිවීම දැව ලබා ගැනීමටත් වඩා වැදගත් වනු ඇත. සෑහෙන පමණ වන ද්‍රව්‍ය සපයා ගැනීම නොවරදින්ට ඇති එකම ක්‍රමය වන රෝපණයයි.



ලංකාවේ වන සෞන්දර්යය දියුණු කරන සත්ව ජීවිත ආරක්ෂා කර ගැනීමද අභය භූමි මෙන් වෙන් කර ඇති වනාන්තර ප්‍රයෝජන වත් වේ. ක්‍රමයෙන් වඳවීගෙන යන සත්ව වර්ග ආරක්ෂා කිරීමේ සත්ව සංරක්ෂණ ව්‍යාපාරය ද ජාතික ධන නිධාන රැකීමේ තවත් අංගයකි. මිනිසා විසින් මෙන් ම ස්වභාවික ආපදවන් නිසාද මෙරට වන සත්තු රැසක් වාර්ෂිකව විනාශ වන්නාහු ය. වන සත්ව ආරක්ෂක නීතිරීති යෙදීම පමණක් නොව වන සතුන්ට නියං කාලයේ දී ජලය පහසුවෙන් ලබා ගන්නට සැලැස්වීම මෙහිලා ඉතා වැදගත් ය. සෞන්දර්ය අතින් පමණක් නොව ගොවියාට ප්‍රයෝජනවත්වන කෘමි වර්ගයේ සතුන් ආරක්ෂා කිරීම ගැනද උනන්දු විය යුතුයි. වන සත්ව ආරක්ෂක දෙපාර්තමේන්තුව මගින් සත්ව සම්පත රැක ගැනීමේ අනුසස් මහජනයා අතර ප්‍රචාරය කරවීම මේ කාරණයෙහිලා ප්‍රයෝජනවත් වනු ඇත.



ධීවර සම්පතද තවත් මෙරට ස්වාභාවික සම්පතක් වශයෙන් ආරක්ෂා කළ යුත්තකි. කරදිය මසුන් මිරිදිය මසුන්ඉස්සන් මුතු බෙල්ලන්ටත් හක්ගෙඩි යන ධීවර සම්පත් මුල්කරගෙන ලංකාවේ දියුණු කළ හැකි ආර්ථික ව්‍යාපාරයක් සකස් වී ඇත. ඒ නිසා මේ මසුන් රැක ගැනීමේ සහ බෝවීම වර්ධනය කිරීමේ කටයුතු ගැන උනන්දු විය යුතුව තිබේ. ධීවර කාර්මිකයන් පවසන පරිදි මෑත අවුරුදු කීපය තුළදී දූල්මාළු ප්‍රමාණය භයානක ලෙස පහළ බැස ඇත. සාගර මසුන්ගේ හීනවීමක් මින් අභවයි. මීට හේතු පරීක්ෂා කර බැලිය යුතුය. මසුන් ඇල්ලීමේ යෝග්‍ය ක්‍රම නොයොද ගැන්මෙන් මාළු බිම්වලට හානි විය හැකිය. මාළු අයින් පරීක්ෂා කර බැලීම මසුන් බෝවීමට වැඩි කිරීමට සුදුසු ක්‍රම යෙදීම හා මසුන් මැරීමේ ක්‍රම හා නවීන ආන්පන්න ඒ වෙනුවෙන් උපයෝගී කර ගැනීම යන කටයුතු සැලසීමෙන් අපේ මත්ස්‍යයන් රැක ගනිමින් ධීවර ව්‍යාපාරය නඟා සිටුවිය හැකි වනු ඇත. ලංකාවේ මිරිදිය මසුන්ද ගැමියාට සම්පතකි. වෙනත් රටවල මෙන් රට ඇතුළත පිහිටි ජලාස වල මිරිදිය මසුන් වගා කිරීමේ ව්‍යාපාර දියුණු කිරීමට ඉඩ කඩ තිබේ. මුතු පෙර සිටම අගේ කෙරුණු ස්වාභාවික සම්පතකි. දනුදු මුතු කිමිදීමෙන් සැහෙන ආදයමක් උපදවයි. එහෙත් මෙතරම් අගනා කර්මාන්තයක පැවැත්ම ඉබේ සිදු වීමට ඉඩ හැරීම නුවනට හුරුනොවේ. මුතු බෙල්ලන් සමූහ වශයෙන් ස්වල්ප කාලයකින් අතුරු දහන්වීමට ඉඩ ඇත. ඒ නිසා ඒ ගැන වහා සොයා බලා මුතු බෙල්ලන් සංරක්ෂණ ක්‍රියා මාර්ගයක් ඇරඹිය යුතුව ඇත. කෘතිම ක්‍රියා වකින් මුතු බෙල්ලන් තුළ මුතු ඇට සාදවා ගැනීම හා වටකරන ලද කොටුවල මුතු බෙල්ලන් ඇති කිරීම ගැන මෙතෙක් සොයා නොබැලීම කණගාටුවට කරුණකි.

ලංකාවේ ජාතික ධන නිධාන සංරක්ෂණයෙහිදී සැලකිල්ල යොමු විය යුතු කරුණු කීපයක් මෙතෙක් විස්තර කෙරිණි. රටක සම්පත් සංරක්ෂණය යන් නෙන් අදහස් කෙරෙන්නේ සම්පත් පරිභෝගයේදී ඒවා නැසී යා නොදී ආරක්ෂා කර ගැනීමත් සම්පත් වර්ධනය කිරීමේ නව ක්‍රියා මාර්ග ආරක්ෂා කිරීමත් ය. නිදහස් ලංකාවේ අනාගත ශ්‍රී සමෘධිය ගොඩ නැංවීම සඳහා එහි ධන නිධාන සංරක්ෂණය කිරීමේ වැදගත්කම අමුතුවෙන් විස්තර කළ යුතු නොවේ. යටත් විජිත වශයෙන් තිබුණු මේ රටේ මේ දක්වා ඒ සම්බන්ධයෙන් තිබුණු සැලකිල්ල ඉතා මඳය. ලංකාවේ ධන නිධාන සංරක්ෂණ භාවයේ සාර්ථක භාවයට මුල් විය යුත්තේ ඒ ඒ සම්පත් අනාවරණය කරණ හා ඒවා සංරක්ෂණය කරවීමේ පිළිවෙත් සොයන විද්‍යාත්මක පරියේෂණයන්ය. මේ සඳහා අපේ විද්‍යා දනුම හා කාර්මික ඥණය උපයෝගී කර ගත යුතුය. පර්යේෂණ මඟින් හෙළි වන වැඩ දයක කරුණු සාමාන්‍ය ගොවි හා කාර්මික ජනතාවගේ අවබෝධයට ඇතුළත් කළ යුතු ය. ධන නිධාන සංරක්ෂණ අගය මහජන පිබිදීමක් ඇති කරණ ජාතික ව්‍යාපාරයක් බවට පත් කළ යුතුය.